ආණ්ඩුකාරවර කාර්යාලය - වයඹ පළාත
ஆளுநர் பணிமனை - வடமேல் மாகாணம்
GOVERNOR'S OFFICE - NORTH WESTERN PROVINCE
'මාලිගාව' කුරුණෑගල. மாளிகாவ குருநாகல் Maligawa, Kurunegala.

මගේ අංකය எனது இலக்கம் My No. NWP/GOV/AD/02/07/II/I

ඔබේ අංකය உமது இலக்கம் Your No.

දිනය திகதி Date 2026.03.06

වයඹ
ප්‍රධාන අමාත්‍යාංශය
16 MAR 2026
AD - 04
කුරුණෑගල.

ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය (වයඹ).

<u>වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම.</u>

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගිරිඋල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස සේවයේ නියුතු එම්.වී.ඩී.ඕ.ටී.කේ.දේවප්‍රිය මහත්මිය (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I) වයස අවුරුදු 60 සම්පූර්ණ වීම ඔන විශ්‍රාම ගැනීම හේතුවෙන් 2026.04.01 දින සිට පුරප්පාඩු වීමට නියමිත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 01ක් සඳහා සුදුසු නිලධාරියෙකු පත් කිරීමට වයඹ පළාත තුළ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා ඉදිරි කටයුතු කිරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

02. ඉහත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරයෙකු පත් කිරීමට අදාළව ලකුණු ලබා දීමේ පටිපාටිය හා ආදර්ශ අයදුම් පත්‍රය මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

03. ඒ අනුව, වයඹ පළාත තුළ සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියේ සුදුසු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා 2026.03.25 වන දිනට පෙර සම්මුඛ පරීක්ෂණ කටයුතු සඳහා අදාල තොරතුරු මා වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ඩබ්.ජී.ඩබ්.වනසිංහ,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

පිටපත
01. ප්‍රධාන ලේකම් (වයඹ පළාත) - කා.දැ.ස

C:\Users\Lenovo\Desktop\කලාප අධ්‍යක්ෂ 2026\ප්‍රධාන අමාත්‍යාංශය.docx

දුරකථන අංකය தொலைபேசி இல. Telephone No. 037 - 2222378
ෆැක්ස් பெக்ஸ் Fax 037 - 2222832
විද්‍යුත් තැපෑල மின் அஞ்சல் E-mail nwpgovernor@gmail.com

CamScanner

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු (I පන්තිය) සඳහා නිලධාරීන් පත්කිරීමට අදාළ ලකුණු පටිපාටිය

නිර්ණායක	ලකුණු ලබා දෙන ආකාරය	උපරිම ලකුණු
01. ජ්‍යෙෂ්ඨතාවය	ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස් වූ දින සිට එක් වසරකට ලකුණු 03 බැගින් වසර 08ක් සඳහා (3x8) - උපරිම ලකුණු 24	30
01.1. වයඹ පළාත තුළ අධ්‍යාපන පරිපාලන සේවයේ සේවය කල කාලය සඳහා	වසරකට ලකුණු 01 බැගින් වසර 06ක් සඳහා (1x6) - උපරිම ලකුණු 06	
02. අධ්‍යාපන සුදුසුකම් (කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කිරීමට සලකා බලන ලද සුදුසුකම් හැර වෙනත් අධ්‍යාපන සුදුසුකම් පමණක් ඉහත ලකුණු දීම සඳහා බලනු ලබන අතර එක් සහනිකයකයට/ ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. කවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල/ආයතන වෙතින් හදාරා ඇති සේවා ව්‍යවස්ථාවේ සඳහන් වන හෝ අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් අදාළ ලකුණු ලබා දෙනු ලැබේ.)	2.1 දර්ශනාගුරු (PhD) - ලකුණු 15 2.2 දර්ශනපති (M Phil) - ලකුණු 12 2.3 පශ්චාත් උපාධිය - ලකුණු 10 2.4 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 07 - උපරිම ලකුණු 15	15
03. ක්ෂේත්‍රයෙහි සේවා පළපුරුද්ද (අදාළ පත්වීම් බලධාරීන් විසින් නිකුත් කර ඇති විධිමත් පත්වීම්/ස්ථානමාරු ලිපි සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)	3.1.විදුහල්පති/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන (ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ තනතුරක එක් වසරක සේවා කාලයකට ලකුණු 04 බැගින් උපරිම වසර 05ක් සඳහා) 3.2.නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය කොමසාරිස්/විදුහල්පති (ශ්‍රී ලං.අ.ප.සේ. II ශ්‍රේණියේ තනතුරක එක් වසරක සේවා කාලයකට ලකුණු 2.5 බැගින් උපරිම වසර 08ක් සඳහා) 3.3. විදුහල්පති/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර කොමසාරිස් /නියෝජ්‍ය විදුහල්පති (ශ්‍රීලං.අ.ප.සේ. III ශ්‍රේණියේ තනතුරක එක් වසරක සේවා කාලයකට ලකුණු 02 බැගින් උපරිම වසර 10 ක් සඳහා) ❖ ඉහත තනතුරක/තනතුරු වල වැඩ බැලීම/රාජකාරී ඉටුකිරීම/රාජකාරී ආවරණය කිරීම සඳහා සිදු කර ඇති පත්වීම් ලකුණු ලබා දීමේදී සලකා බලනු නොලැබේ. (පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 121) උපරිම ලකුණු 20	20
04. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන	4.1 පර්යේෂණ - ලකුණු 2.5x2 (ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට (Research Symposium)ඉදිරිපත් කරන ලද හෝ පර්යේෂණ සඟරාවක (Research Journal) පළ කරන ලද පර්යේෂණ වාර්තා සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)	05

	4.2. ග්‍රන්ථ ලකුණු2.5 x2 (අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මඟින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරිත්වයක් දරන ග්‍රන්ථ සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) (පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබාදෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මඟින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරිත්වයක් දරන ග්‍රන්ථ සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) 4.3. අධ්‍යාපන ප්‍රකාශන සඳහා ලබාදෙන ලද වාර්තා හා ශාස්ත්‍රීය සංග්‍රහ එකකට -ලකුණු 2.5 x 2 -උපරිම ලකුණු 05 ❖ (ජාතික/ජාත්‍යන්තර මට්ටමින් ඉදිරිපත් වූ ප්‍රකාශනයට ලබාදුන් ලිපියක්/වාර්තාවක්) ❖ (ජාතික/ජාත්‍යන්තර මට්ටමේ ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡ මණ්ඩපයකට ((Research Symposium) ඉදිරිපත් කරන ලද වාර්තා සඳහා සහතිකයක් ලබා තිබීම)	
05. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම	ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් ඇගයීමට ලක් කරනු ලැබේ. - උපරිම ලකුණු 05	05
06. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය	ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් සන්නිවේදන කුසලතාවය සලකා බලනු ලැබේ. - උපරිම ලකුණු 05	05
07. ඉදිරිපත් කිරීම (අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් තමා දක්වා ඇති දායකත්වය පදනම් කරගෙන කරනු ලබන ඉදිරිපත් කිරීම. ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (Power Point) හෝ වෙනත් සුදුසු මාධ්‍යයකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර සිදු කරනු ලබන එම ඉදිරිපත් කිරීමට අදාළ දෘඪ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ.)	i. ප්‍රවේශය හා හැඳින්වීම - ලකුණු 02 ii. අන්තර්ගතය - ලකුණු 02 iii. කාල කළමනාකරණය - ලකුණු 02 iv. ඉදිරිපත් කිරීමේ විලාශය - ලකුණු 02 v. නිමාව හා නිගමනය - ලකුණු 02 උපරිම ලකුණු 10	10
08. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලැබූ සමස්ථ කුසලතාවය	- උපරිම ලකුණු 10	10
මුළු ලකුණු		100

CamScanner

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර (1 පන්තිය) සඳහා අයදුම් පත්‍රය

01. නිලධාරියා පිළිබඳ විස්තර

1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්/ දෙමළෙන්) : .....මයා/ මිය/මෙනවිය

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr/Ms/Mrs .....

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : .....

1.4 ස්ත්‍රී/ පුරුෂ භාවය

ස්ත්‍රී - F පුරුෂ - M (අදාළ සංකේතය කොටුව තුල සඳහන් කරන්න)

1.5 උපන් දිනය: වර්ෂය: ..... මාසය: ..... දිනය: .....

1.6 ජාතික හැඳුනුම්පත් අංකය

02.

2.1 රාජකාරී ලිපිනය:.....

2.2 සථිර පදිංචි ලිපිනය: .....

2.3 දූරකථන අංකය : රාජකාරී:..... පෞද්ගලික:.....

03.

3.1 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ දිනය:.....

3.2 වර්තමාන ශ්‍රේණිය :.....

3.3 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් වූ දිනය:.....

3.4 2026.03.25 දිනට එම ශ්‍රේණියේ සේවා කාලය : අවු: ..... මාස:.....දින:.....

04.

4.1 වර්තමාන තනතුර :.....

4.2 වර්තමාන තනතුරට පත් වූ දිනය :.....

4.3 2026.03.25 දිනට එම තනතුරෙහි සක්‍රීය සේවා කාලය: .....

CamScanner

05. පූර්ව සේවා විස්තරය (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ දින සිට)

ආයතනය	කාල වකවානුව		නිලධාරියා දැරූ තනතුර
	දින සිට	දින දක්වා	

06. අධ්‍යාපන සුදුසුකම් :

පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ දර්ශනපති (M Phil)/ දර්ශනශූරී (PhD)	මාධ්‍ය	ආයතනය	සහතිකය ලැබුණු දිනය

07. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති කොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වන බවත් ප්‍රකාශ කර සිටිමි.

....

දිනය අයදුම්කරුගේ අත්සන

08. ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

ඉහත කොරතුරු සඳහන් .....මයා/ මිය/ මෙනවිය වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ / ..... ජාතික පාසලේ සේවය නිසුදු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරියෙකු/ නිලධාරිනියක බවත් ඔහු/ ඇය විසින් ඉදිරිපත් කර ඇති කොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත් මෙම අයදුම්කරුට විරුද්ධව කිසියම් විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන /පැවැත්වෙන බවත්, උසාවියකින් දඩුවම් ලබා ඇති / නොමැති බවත් මෙයින් සහතික කරමි.

දිනය : ....

ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

CamScanner

09. ආයතන දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / අමාත්‍යාංශ ලේකම්ගේ සහතිකය (ජාතික පාසල්වල සේවය කරන නිලධාරීන් සඳහා)

ඉහත තොරතුරු සඳහන් .....මයා/ මිය/ මෙනවිය ..... ජාතික පාසලේ සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරියෙකු/ නිලධාරිනියක බවත් ඔහු/ ඇය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවත් මෙම අයදුම්කරුට විරුද්ධව කිසියම් විනය පරීක්ෂණයක් පැවැත්වෙන / නොපැවැත්වෙන බවත්, උසාවියකින් දඩුවම් ලබා ඇති/ නොමැති බවත් මෙයින් සහතික කරමි. මෙම නිලධාරියා/ නිලධාරිනිය ඉහත තනතුරක් සඳහා තෝරාගනු ලැබුවහොත් සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව නිදහස් කිරීමට එකඟ වෙමි.

දිනය : .....

.....

ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

CamScanner